# ගල්වඩුවා



ගල් වඩුවා නමැති මේ ළමා කතාව ළමා චිත්‍රපටියකින් පිළියෙල කර ගත්තකි. මෙහි කතා වස්තුව තජික් කතාවකින් ආර්. කුෂ්නේරෝවිච් විසින් පිළියෙල කරන ලදි. චිත්‍ර ආර්. විනකුරොව් සහ ෂ්වාර්ට්ස්මාන් විසිනි.

ගල්වඩුවා

අනුවාදය : දැදිගම වී. රුද්‍රිගු

ISBN 978-955-1979-80-3


ප්‍රකාශනය : සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
අංක 91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

මුද්‍රණය : Kanol PRINT




# ගල්වඩුවා


**සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම**
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08




එකෝමත් එක රටක ගල් වඩුවෙක් ගල් කඩමින් හිටියා. හිටි හැටියේම අසුන් පිට නැග ගත් මිනිසුන් කෑ ගහන හැටි ඇසුණා:
"දණ ගහපල්ලා! ආචාර කරපල්ලා!"



සුදුපාට ඇතෙකු එන හැටි ගල් වඩුවා දැක්කා. ඇතා පිට වාඩි වී හිටියා රජ කෙනෙක්. ගල් වඩුවා දණ ගසා රජතුමාට ආචාර කළා. ඔහු මෙහෙම සිතුවා: "රජතුමාට මාව පෙනෙන්නේවත් නැහැ. එහෙනම්, මම නමස්කාර කරන්නේ ඇතාට වෙන්න ඕන. ඇතා බොහොම වැදගත් සතෙක්."




"ඇතාත් මට වඩා හොඳින් ජීවත් වෙනවා. මටත් ඇතකු වෙන්න ඇත්නම් කොතරම් හොඳද" කියලා ගල් වඩුවා හිතුවා. එහෙම හිතුවා විතරයි ගල් වඩුවා එකවරම ඇතකු වුණා.




ඇතා බවට පත් වුණු ගල් වඩුවාගේ පිට උඩ රජා වාඩි වෙලා තේ බොනවා. රජ්ජුරුවන්ගේ උණු තේ කෝප්පයෙන් උණු තේ ටිකක් ඇතාගේ පිටට වැටුණා. උගේ පිට රිදුනා. "මීට වැඩිය හොඳයි රජ කෙනෙකු වෙනවා නම්" කියලා ගල්වඩු ඇතා සිතුවා. එහෙම සිතුවා විතරයි, ගල්වඩු ඇතා රජ කෙනෙකු බවට පත් වුණා.




ඔන්න දැන් ගල්වඩු රජතුමා සුදු ඇතා පිට නැගිලා යනවා. රජතුමා උණු තේ බීලා සතුටු වුණා....



සතුට අසතුටට හැරුණා. බොහොම සැරට ඉර පායන්නට වුණා. රජතුමාට ඇස් අරින්නවත් බැහැ. කඳුළු ගලන්නට වුණා. ඉර අව්ව එතරම් සැරයි. “ඉර මටත් වඩා බලසම්පන්නයි. මා කැමතියි ඉර වෙන්ට” රජා සිතුවා.



සිතුවා විතරයි, ගල්වඩු රජා එක පාරටම ඉර බවට පත් වුණා. එදා සිට මේ අලුත් ඉර පායන්නට පටන් ගත්තා. ඉර අව්ව නිසා මහ පොළොව ගිනි රත් වුණා.



අහසේ වලාකුළු ඇති වෙලා, වැහි වලාවක් හැදුණා. මේ වැහි වලාකුළ නිසා ඉර අව්ව මහ පොළොවට පායන්නේ නැහැ. ඉර තරහ වෙලා මෙහෙම සිතුවා: "මා කැමතියි වැහි වලාකුළක් වෙන්ට!"




සිතුවා විතරයි ගල්වඩු ඉර එකවරම වැහි වලාවක් වුණා. දැන් ඉතින් කුණාටුවට අසු වෙච්ච වැහි වලාව අහස හැම තැනම දුවනවා. "හරි වැඩක් නෙව, මාව හැමතැනම එළවන්නේ කවුද? කුණාටුව තමයි! මා කැමතියි කුණාටුවක් වෙන්නට!"



සිතුවා විතරයි, ගල්වඩු වැහි වලාව කුණාටුවක් වෙලා ඉවරයි. කුණාටුව වේගයෙන් හමන්නට වුණා. ගස්, වැල්, ගෙවල්වල වහලවල් කැඩිලා බිම වැටුණා. බොහොම සැර කුණාටුවක්!




මේ කුණාටුව ලොකු ගල් කන්දක හැපිලා බිඳුණා. "ගල් කන්ද මටත් වඩා බලසම්පන්නයි. මා කැමතියි ගල් කන්දක් වෙන්නට" එතකොටම කුණාටුව...



....ගල් කන්දක් වුණා. කඳු මුදුන වලාකුළුවලටත් වඩා උසයි. කඳු පාමුල ඉන්න මිනිසුන් බොහොම පුංචියි. මහ විසාල කන්ද මිනිසුන් කරන වැඩ ගැන සැලකුවේ නැහැ.



හයිය ඇති අත් දෙකක් ඇති මිනිහෙක් ලොකු ගල් කටුවක් අරගෙන එන හැටි ගල් කන්ද දැක්කේ නැහැ. මිනිහා ගල් කටුවෙන් කන්දට ඇන්නා.



"මිනිහා තමා අනිත් හැම දේටම වඩා බලසම්පන්න" ගල් කන්ද වේදනාවෙන් කෑ ගහන අතර සිතුවා. "මා කැමතියි මිනිහෙකු වෙන්නට!" ඔන්න එතකොට ගල්කන්ද එකවරම මිනිහෙකු වුණා. ගල්වඩු ගල්කන්ද නැවත ගල් වඩුවකු වෙලා ගල් කඩන්නට පටන් ගත්තා.



අසුන් පිට නැග ගත්තු රාජ සේවකයෝ කෑ ගහන්නට වුණා. "රජතුමා වඩිනවා. දණ ගහපියව්, නමස්කාර කරව්!" ඇතකු, රජකු, වැහිවලාවක්, කුණාටුවක්, ගල් කන්දක් බවට පත්වෙලා ආයෙමත් ගල් වඩුවකු වුණු මිනිහා මෙහෙම සිතුවා. "දණ ගහන්නේ නැහැ!"



ඔහු දණ ගැසුවේ නැහැ. ඔහු දණ ගැස්සවීමට පුළුවන් මහ බලවතෙක් ලෝකයේ නැහැ. මිනිහා යටත් වන්නේ පිටින් ඇති බලයක් නිසා නොවෙයි. තමාගේම බියසුළු, නිවටකම් හන්දා.

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08
දුරකථන: 011 2669889 ෆැක්ස්: 011 2691610

ISBN 978-955-1319-04-4
9 789551 319045

මිල රු. 200/-